**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - 2017**

**-----------------------------------------------**

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් ආයෝජන බැංකු පනතේ 65(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාරව බැංකුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරනයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2 .2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වයඹ දිරිය ව්‍යාපෘතිය යටතේ 2017 දෙසැම්බර් මාසයට අදාල පිළිවෙලින් රු.420,000 ක් හා රු.1,112,305 ක් වූ ණය නිදහස් කිරීම් ණය අයකර ගැනීම් ආන්තික ගිණුමේ (Margin Account) සටහන් කර නොතිබුණු අතර 2016 දෙසැම්බර් සඳහා රු.2,040,000 ක්වූ ණය නිදහස් කිරීම් හා රු.1,100,658 ක් වූ ණය ආපසු අයකර ගැනීම් 2017 වර්ෂයේ ආන්තික ගිණුමේ සටහන් කර තිබුණි.

(ආ) 2017 වර්ෂය හා පසුගිය වර්ෂය තුල ශාඛා ජංගම ගිණුමට ඍජුව ලැබී තිබුණු එකතුව රු.2,436,835 ක් වූ මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිණුම්වලට ගෙන නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උගස්කර, ඊපීඑෆ් සහ පුද්ගලික ණය සම්බන්ධව පරිගණක පද්ධති ණය ලිපිගොනු ලැයිස්තුවල ශේෂ සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ අතර රු.6,975,092 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් සංසන්දනය කර නොතිබුණි.

(ආ) උගස්කර, ඊපීඑෆ්, පුද්ගලික හා ක්ෂුද්‍ර ණය සම්බන්ධව 2017 දෙසැම්බර් 31 දිනට හානිකරණ ගණනය සඳහා යොදාගත් ලැයිස්තුවල දැක්වෙන ණය ශේෂ සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ අතර රු.234,228 ක ශුද්ධ වෙනස්කමක් නිරීක්ෂණය විය.

(ඇ) අන්තර් ශාඛා ගිණුම්වල රු.4,268,346 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා සේවක අර්ථ සාධක හා සේවක භාරකාර ප්‍රේෂණ පත්‍රවල පෙන්වන වටිනාකම සහ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන වටිනාකම අතර රු.2,923,635 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ පෙර වර්ෂ ගැලපීම් යටතේ රු.493,558 ක හඳුනා නොගත් වෙනස්කම් ශේෂයක් දක්වා තිබුණි.

(ඊ) ඉතිරි කිරීම් යෝජනා ක්‍රම තැන්පතුවලට අදාල පරිගණක පද්ධතියෙන් ලබා ගත් ශේෂ සහ මූල්‍ය ප්‍රකාශන ශේෂ අතර රු.250,867 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් සම්බන්ධයෙන් අලෙවි අංශයේ වාර්තාවල දැක්වෙන ශේෂ සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ අතර රු.2,632,245 ක වෙනස්කමක් නිරීක්ෂණය විය.

(ඌ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන un appropriated ගිණුමේ ශේෂය හා අදාල පරිගණක නිමැවුම් ලැයිස්තු ශේෂ අතර රු.28,883,653 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල තැන්පතු සහ ඉදිරියට කරන ලද ගෙවීම් යටතේ රු.5,362,744 ක්වූ අත්තිකාරම් ශේෂය තුළ ඇතුලත් 2016 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන ලද රු.2,917,537 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් හඳුනාගෙන නොතිබුණි. එම නිසා මෙම ශේෂයේ විශ්වාසනීය බව හා අයකර ගැනීම පිළිබඳව විගණනයට තහවුරු කළ නොහැකි විය.

(ආ) බැංකුව අනුගමනය කරන ලද ගිණුම්කරණ ක්‍රමය අනුව, ශාඛා ඇඩ්වයිස් ගිණුමේ (branch advice account) ශේෂය බැර ශේෂයක් විය යුතුය. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ශාඛා ඇඩ්වයිස් ගිණුමේ නිරවුල් නොකරන ලද රු.7,529,740ක ශේෂයක් නිරීක්ෂණය විය.

(ඇ) සාමාන්‍යයෙන් හිමිකම් වවුචර ගිණුමේ (Claim voucher account) හර ශේෂයක් තිබිය යුතු වුවද, එම ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට රු.23,590,021 ක අසාමාන්‍ය බැර ශේෂයක් දක්නට ලැබුණි.

(ඈ) අනෙකුත් ණයගැති යටතේ වර්ෂ දෙකකට වැඩි කාලයක් ගිණුම් හයක රු.1,513,448 ක් වූ ශේෂ හඳුනාගැනීමකින් තොරව ඉදිරියට ගෙන එමින් පවතින අතර එම ශේෂයන් අයකර ගැනීම අවිනිශ්චිත විය.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණයගැතියෝ යටතේ සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් සහායක ගිණුමේ (assistant to provident fund account) සහ හර බදු ගිණුමේ පිළිවෙලින් රු.1,512,882 ක් හා රු.6,696 ක හර ශේෂ පෙන්නුම් කරනු ලැබූ අතර, මෙම ශේෂ අදාල පාර්ශව විසින් සනාථ කර නොතිබූ බැවින් මෙම ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත විය.

(ඊ) 1988 සිට 2014 වර්ෂය දක්වා විවිධ ණය ශේෂ තුල ඇතුළත් රු.139,936 ක් වූ මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(උ) 2017 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ණය ගැතියෝ යටතේ වූ චෙක්පත් උපලබ්ධි ගිණුමේ (Cheques on Realization Account) රු.14,265,463 ක අසාමාන්‍ය හර ශේෂයක් දක්නට ලැබුණු අතර එය මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ණයගැතියෝ සමාන අගයකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු ගිණුමේ රු.3,005,380 ක හඳුනානොගත් හර ශේෂයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(එ) බැංකුව විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය අනුව සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් ශේෂය මත ප්‍රදානය කරනු ලැබූ උගස්කර ණය සැකසීමේ ගාස්තු එම ණය ප්‍රදානය කල මාසයට පසු මාසයේ 20 දිනට පෙර සහකාර කම්කරු කොමසාරිස් වෙත ගෙවිය යුතුය. කෙසේ වුවද, ගෙවිය යුතු ඒසීඑල් ගාස්තු ගිණුමේ (Payable ACL Charges Account)

හඳුනානොගත් රු.179,500 ක හර ශේෂයක් පැවති අතර 2017 දෙසැම්බර් 31 දිනට ණය හිමියෝ ලෙස වර්ෂයකට වැඩි කාලයක සිට පැවතෙන රු.216,500 ක් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් වත්කම් යටතේ දක්වා තිබුණු නොසැසඳුනු ගිණුමට අදාල රු.22,350,414 හර ශේෂයට ප්‍රමාණවත් තොරතුරු නොමැතිවීම නිසා අයකර ගැනීම අවිනිශ්චිත වී තිබුණි.

### 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දක්වා ඇති ආකෘතිය අනුව පරිගණක සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කල යුතු වුවද, බැංකුව රු.127,189,798 ක් වටිනා පරිගණක සඳහා එවැනි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 396 | ගෙවීම් කිරීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්මවූ රු.1,792,650 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව පියවර ගෙන නොතිබුණි. |

### 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තොර ගනුදෙනු

2016 ජූලි 29 දිනැති අංක 16.07.83.07 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි රු.200,000 ඉක්මවන ඇස්තමේන්තු සහකාර සාමාන්‍යාධිකාරී විසින් අනුමත කල යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවී කිරිබත්ගොඩ ශාඛාව නැවත ස්ථානගත කිරීම වෙනුවෙන් වූ රු.314,145 ක ඇස්තමේන්තුව ප්‍රධාන කළමනාකරු විසින් අනුමත කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 379 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 706 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 327 ක පිරිහීමක් දක්නට ලැබුණි. හානිකරණ ගාස්තු රු.190,115,588 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා බලපෑ ප්‍රධාන හේතුව විය.

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලය රු.173,457,667 ක් දක්වා අඩු වී තිබුණද, සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් හා රජයට ගෙවිය යුතු බදු සැලකිල්ලට ගත් පසු බැංකුවේ එකතු කළ අගය 2013 වර්ෂයේ රු.933,770,458 සිට 2016 වර්ෂයේ රු.1,662,254,618 ක් දක්වා ක්‍රමිකව වැඩි වී තිබුණි. කෙසේ වුවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එය රු.344,599,816 කින් හෙවත් සියයට 21 කින් අඩු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, බැංකුවේ සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2017 | | 2016 | |
|---|---|---|---|---|
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | ආංශික බලපත්‍රලාභී විශේෂිත බැංකු | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | ආංශික බලපත්‍රලාභී විශේෂිත බැංකු |
| **ලාභදායී අනුපාත** | | | | |
| i ශුද්ධ පොළී ආන්තිකය | 4.35 | 3.2 | 5.36 | 3.5 |
| ii ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE) | 3.52 | 19.2 | 9.50 | 18.3 |
| iii වත්කම් සාමාන්‍ය මත ප්‍රතිලාභය (ROA) | 0.97 | 1.5 | 2.03 | 1.5 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත** | | | | |
| පෙළ 1 | 23.74 | 12.8 | 22.96 | 13.5 |
| **ද්‍රවශීලතා අනුපාත** | | | | |
| ද්‍රවශීල වත්කම්/තැන්පතු | 22.10 | 61.6 | 22.82 | 61 |

බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව ශුද්ධ පොළී ආන්තිකය සියයට 1.15 කින් වැඩි වුවද, සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභ සියයට 15.68 ක පහළ අගයක පැවතුණි. තවද, 2016 හා 2017 යන වර්ෂ දෙකෙහිදීම ආංශික අනුපාතයන් සමඟ සැසඳීමේදී බැංකුවේ ද්‍රවශීලතාවය වඩාත් පහළින් පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) 2017 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්මේ 07 වැනි ඉලක්කය අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට පුද්ගලික ණය හා උගස්කර ණය සඳහා වන අක්‍රීය ණය අනුපාතය පිළිවෙලින් සියයට 03 ක් හා සියයට 05 ක් දක්වා අඩු කිරීමට ඉලක්ක කර තිබුණි. කෙසේ වුවද, ශාඛා 04 ක් පුද්ගලික ණය ඉලක්ක සපුරා ගැනීමට හා ශාඛා 12 ක් උගස්කර ණය ඉලක්ක සපුරාගැනීමට අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) බැංකුවේ ශාඛා මෙහෙයුම් අංශය විසින් ලබාදුන් ණය ලබාදීමේ ඉලක්ක අනුව 2017 වර්ෂය අවසානය වන විට ශාඛා 24 කින් ශාඛා 06 ක් ඉලක්කවලින් සියයට 75 ක් ළඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) අලෙවි අංශය 2020 වන විට රු.බිලියන 2 ක ලාභයක් ලබාගැනීම ප්‍රධාන අරමුණු කරගෙන 2016/2017 වර්ෂය සඳහා අලෙවිකරණ සැලැස්ම පිළියෙල කර තිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂය හා සංසන්දනය කරන විට 2017 වර්ෂයේදී බැංකුවේ බදු පසු ලාභය රු.257,493,476 ක් හෙවත් සියයට 59 කින් අඩු වී තිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ළමා බැංකු සංකල්පය 2017 දෙසැම්බර් 31 දින වන විටත් මූලික අදියරේ පැවතුණි.

(ඉ) 1975 අංක 30 දරණ රාජ්‍ය උගස් හා ආයෝජන බැංකු පනතේ 2(2) දරණ වගන්තියට අනුව, මෙම පනතේ විධිවිධානවලට අනුකූලව මූල්‍ය හා අනෙකුත් සහායන් ලබාදීම මගින් කෘෂිකාර්මික, කාර්මික හා නිවාස සංවර්ධන කටයුතු වෙනුවෙන් සහාය වීම බැංකුවේ අරමුණ වේ. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මහ බැංකුව විසින් ලබාදුන් තොරතුරු පරිදි බැංකුව සිය ණය ආයෝජනවලින් සියයට 99.9 ක් කෘෂිකාර්මික හා නිවාස ණය වශයෙන් ගණුදෙනුකරුවන්ට ලබා දී තිබුණි.

(ඊ) බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් වර්ෂයකට සියයට ඒඩබ්පීඑල්ආර්+1.2 (AWPLR+1.2%) වාර්ෂික විචල්‍ය පොලී අනුපාතයකට රු.බිලියන 2 ක ණයක් ලබාගෙන තිබුණි. ඒඩබ්පීඑල්ආර් (AWPLR) අගය සියයට 10 ක් වුවහොත් ගිවිසුමේ අර්ධ වාර්ෂික පොලී සංශෝධන නොසලකා බැංකුව ආසන්න වශයෙන් රු.මිලියන 224 ක පොලී මුදලක් ගෙවිය යුතු වේ. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට බැංකුව සියයට 22 ක අක්‍රීය ණය ප්‍රතිශතයක් වාර්තා කර තිබූ අතර මෙම පසුබිම පිළිබඳ සලකා බැලීමෙන් පසු මෙම ණය අරමුදල් උපයෝජනය කර ගනිමින් බැංකුවට ප්‍රශස්ථ ආදායමක් ලබා ගැනීමේ හැකියාව සැක සහිත විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) 1996 වර්ෂයේ සිදුවූ වංචාවක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ණය ගැතියෝ යටතේ රු.2,400,000 ක් වංචා ගිණුමක දැක්වෙන අතර මෙම සිදුවීම නිරාකරණය කිරීමට සහ අලාභය අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 වර්ෂය තුල රු.9,613,360 ක් වටිනා වත්කම් බැහැර කිරීමට බැංකුව කටයුතු කර තිබුණි. කෙසේ වුවද, පැරණිම වත්කම් හඳුනාගෙන එම අයිතම බැහැර කර පොත්වලින් ඉවත් කරනු වෙනුවට ඒවා පොත්වලින් ඉවත් කිරීම සිදුකර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(අ) ලද තොරතුරු අනුව, පසුගිය වර්ෂය හා සංසන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂය තුල මුදාහල ණය වටිනාකම රු.මිලියන 2,381 කින් හෝ සියයට 29 කින් වැඩි වී තිබූ අතර ලබා දුන් ණය සංඛ්‍යාව 429 කින් හෝ සියයට 3 කින් අඩු වී තිබුණි. තවද, පසුගිය වර්ෂය හා සංසන්දනය කරන විට මෙම වර්ෂයේ මුදාහල ණයවලින් කුඩා හා මධ්‍යම ව්‍යාපාර ණය හා ක්ෂුද්‍ර ණය මුදල් සියයට 2975 කින් වැඩි වී තිබූ අතර පුද්ගලික ණය සියයට 79 කින් වැඩි වී තිබුණි.

(ආ) බැංකුව විසින් ප්‍රදානය කළ රු.මිලියන 32,540 ක් වූ ණය පහසුකම් අතරින් රු.මිලියන 7,466 ක් හෝ සියයට 23 ක් 2017 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය වශයෙන් දැක්වුණි. තවද, මුළු සේවක අර්ථසාධක ණය වලින් රු. මිලියන 5,894 ක් හෝ සියයට 18 ක් 2017 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය ලෙස වාර්තා කර තිබුණි.

(ඇ) අක්‍රීය ණය කාල විශ්ලේෂණය කිරීමේදී පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 දෙසැම්බර් 31 දිනට වූ මුළු අක්‍රීය ණය ප්‍රමාණය රු.මිලියන 7,460 ක් වූ අතර ඉන් රු.මිලියන 4,106 ක් හෝ සියයට 55 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණු අතර එම මුදලින් රු.මිලියන 3,670 ක් සේවක අර්ථසාධක අරමුදල් ණය නියෝජනය විය.

(ii) වර්ෂ 03 කට වැඩි අක්‍රීය මුළු ණයවලින් රු.මිලියන 66 ක් අත්පත් කරගත් දේපළ නියෝජනය විය.

(iii) මුළු අක්‍රීය ණය මුදල් ශේෂයන්ගෙන් රු.මිලියන 48 ක් ප්‍රධාන උගස්කර ණය මුදල් 07 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟව පැවති අතර එයින් එකතුව රු.මිලියන 46 ක් වූ ණය මුදල් 04 ක් සඳහා නීතිමය පියවර ගෙන නොතිබුණි.

(iv) මුළු අක්‍රීය ණය ශේෂයන්ගෙන් රු.මිලියන 18 ක් වූ ප්‍රධාන පුද්ගලික අක්‍රීය ණය මුදල් වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟව පැවතුණි.

**4.4 මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අනුව උපයනවිට බදු (PAYE) සේවක වැටුප් වලින් අඩුකල යුතුය. එයට අනුගත නොවී, රු.20,122,583 ක වටිනාකමක උපයන විට ගෙවීම් බදු, අදාල සේවකයන්ගේ වැටුපින් අඩු නොකර සේවකයන් වෙනුවෙන් බැංකුව විසින් ගෙවා තිබුණි.

**4.5 දෘෂ්‍යමාන අක්‍රමිකතා**

පුද්ගලයින් 47 දෙනෙකු සාවද්‍ය ලියකියවිලි සහ තොරතුරු වලින් මුළු වටිනාකම රු.මිලියන 68.34 ක ණය මුදල් ලබාගෙන තිබුණු අතර එම මුළු ණය වටිනාකම් 2017 දෙසැම්බර් 31 දින අක්‍රීය ණය ශේෂයේ ඇතුළත් කර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකුවේ කාර්ය මණ්ඩල තත්ත්වය අනුව, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 471 ක් හා 365 ක් වූ අතර ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට 106 ක පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතුණි.

(ආ) බැංකුවේ සුමට ක්‍රියාකාරීත්වයට බලපාන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු තුනක්, සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු තුනක් හා ප්‍රධාන කළමනාකාර තනතුරු හතරක් ඉහත පුරප්පාඩු තුළ ඇතුළත් වී තිබුණි.

**4.7 වෙළඳපොල කොටස**

2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා බලපත්‍රලාභී විශේෂඥ බැංකු අංශය හා සසඳන විට බැංකුවේ තැන්පතු මත වෙළඳපොල කොටස පදනම් ඒකක 2 කින් වැඩි වී තිබුණි. තවද, බලපත්‍රලාභී විශේෂඥ බැංකු අංශය හා සසඳන විට බැංකුවේ වත්කම් මත වෙළඳපොල කොටස 2013 වර්ෂයේ සිට 2017 වන විට පදනම් ඒකක 17කින් වැඩි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2016 ජනවාරි 01 දින සිට බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතුණි.

### 5.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 5.2.1 ප්‍රසම්පාදනයන්

(අ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රධාන කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් හා හොරණ ශාඛාව සඳහා නව ඉඩමක් හා ගොඩනැගිල්ල මිලදී ගැනීම වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 1,300 ක් හා රු.මිලියන 62 ක් ඇස්තමේන්තුගත කර තිබුණි. කෙසේ වුවද, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, නව ගොඩනැගිල්ලේ ප්‍රසම්පාදන කටයුතු මූලික අදියරේ පැවති අතර හොරණ ශාඛාව සඳහා ඉඩමක් මිලදී ගැනීමට බැංකුව අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 (ඉ) පර්ච්ඡේදය අනුව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 ක් නොඉක්මවන පරාසයක් තුල නිතිපතා යාවත්කාලීන කළ යුතුය. මෙම මඟපෙන්වීමට බැංකුව විසින් අනුගත වී නොතිබුණි.

(ඇ) 2017 ප්‍රසම්පාදන සැලැස්ම අනුව, බැංකුව ශාඛා පහක ධාරිතාවය ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, බැංකුව යථෝක්ත ඉලක්කය සපුරා ගැනීමට මුළුමනින්ම අපොහොසත් වී තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.3.2 (ඇ) පරිච්ඡේදය අනුව, ප්‍රසම්පාදන කාර්ය මණ්ඩලය පිරිවිතර ඇතුලත් ලංසු ලියකියවිලි කෙටුම්පත් කිරීමට හා ඒවා සමාලෝචනය කිරීමට හා අනුමැතිය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට (TEC) ඉදිරිපත් කිරීම සඳහා පියවර ගැනීමට වගකිව යුතු වේ. කෙසේ වුවද, ශාඛා 08 ක හා ප්‍රධාන කාර්යාලයේ පාටිෂන් කිරීමේ කටයුතු සඳහා 2017 දෙසැම්බර් මස වැය කරන ලද රු. 2,370,878 ක් සම්බන්ධයෙන් බැංකුව ඉහත පියවර ගෙන නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 6.3.2 පරිච්ඡේදය අනුව ලංසු ලියකියවිලිවල නියමකර ඇති පරිදි ලංසු ලබාගැනීම නියමිත වේලාවට අවසන් කල යුතු අතර පමාවී ලැබෙන ලංසු විවෘත නොකර පිළිනොගෙන ආපසු යැවිය යුතුය. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවී බැංකුව ඉහත දැක්වූ ප්‍රසම්පාදන කාර්යයන් නියමිත දිනට පමාවී ලංසු ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවෙකුහට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.1.1(අ) ඡේදය අනුව, පිරිවිතර හා සැලැසුම් (drawings) ඇතුලත් ලංසු ලියවිලි කෙටුම්පත් කිරීම ප්‍රසම්පාදන ආයතනය විසින් සිදුකළ යුතුය. බැංකුව රු.2,112,357 ක් වටිනා පරිගණක මිලදී ගැනීමේ ලංසු ලියවිලි පිළියෙල කිරීමේදී තාක්ෂණික පිරිවිතර ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 අයවැය පාලනය

ණය පොළී වියදම, කාර්ය මණ්ඩල අධ්‍යයන හා පුහුණු වියදම්, ස්ථාවර වත්කම් සහ ණය ගැනීම්වලට අදාල සංශෝධිත අයවැය සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායික කලමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබූ බව පිළිබිඹු විය.

## 6. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර දන්වා යවන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | පොදු ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | ගිණුම්කරණ අඩුපාඩු හා පැහැදිලි නොකළ වෙනස්කම් හඳුනාගැනීමට අවධානය යොමුකර නොතිබුණි. |
| (ඇ) වෙළඳපළ කොටස පවත්වාගෙන යාම | වෙළඳපළ කොටසේ පිළිගත හැකි වර්ධනයක් ලබා නොතිබුණි. |
| (ඇ) ලේඛන නඩත්තු කිරීම | ඉන්වෙන්ට්‍රි අංක සඳහන් කර නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනයේ විස්තර ඇතුළත් කර නොතිබුණි. ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |